# ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය
# නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්ථාව - 2013



# ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය දර්ශනය වනාහි

## සෞන්දර්ය අධ්‍යයන අංශයන්හි අවශ්‍යතා සපුරන ලෙසින් ප්‍රමුඛතම ආයතනයක් බවට පත්කිරීමයි.

# ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

## මෙහෙවර වනාහි

**ශ්‍රී ලංකාවේ සංස්කෘතියට ආවේනිකවූ සම්පත් සවිබල ගන්වා ආරක්ෂා කිරීමත් තමන් තෝරා ගත් සෞන්දර්ය අධ්‍යයනය ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි දැනුම හා කලා කුසලතාවයන් ලබා ගැනීම සඳහා මඟ පැදීමෙන් රැකියා ලබා ගැනීමට හැකිවනසේ උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමත්වේ.**

# ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය,
# ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයය

## අරමුණු

**1වන අරමුණ**

ඉගැන්වීම්, පර්යේෂණ සහ දැනුම ව්‍යාප්තිය තිසි ක්‍රියාවේ යෙදවීම තුළින් විශිෂ්ඨත්වය කරා ළඟා කරවීම.

**2වන අරමුණ**

මානව සම්පත්, යටිතල ව්‍යුහය හා අනෙකුත් සම්පත් සංවර්ධනය තුලින් ආයතනීය තත්ත්වය පුළුල් කිරීම.

**3වන අරමුණ**

පොදු සමාජ ආර්ථිකය හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් සඳහා වූ සේවාවන් සැපයීම.

**4වන අරමුණ**

# යහපාලනය වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම.

**කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයන්**

සභාපති: ආචාර්ය කේ.කෝබින්දරාජා – උප කුලපති, නැගෙනහිර විශ්ව විද්‍යාලයය

අධ්‍යක්ෂක: ආචාර්ය කේ.ප්‍රේමකුමාර් – ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

පීඨාධිපති: ආචාර්ය කේ.රාජේන්ද්‍රම් – කලා හා සංස්කෘතික පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභා නියෝජිත – මහාචාර්ය එස්.මෞනගුරු
පූජ්‍ය ජෝසප්මේරි

පූජ්‍ය ශ්‍රීමත් ස්වාමි සර්වරූපානන්දජී මහරාජ්

සනාතන මණ්ඩල නියෝජිත – පී. සච්චිදානන්දම් මහතා
එම්.නදීරා මිය

ශාස්ත්‍රීය පාලක මණ්ඩල නියෝජිත – ආචාර්ය එස්.ජෙයසංකර්
එස්.සුබ්‍රමණියම් මෙනවිය

පාලක සභා නියෝජිත – එම්.එම්.මහුරූෆ්ජ් කරීම්
පී.එස්.එම්.චාල්ස් මිය

භාණ්ඩාගාරික නියෝජිත – ආර්.නෙඩුන්චේලියන් මයා

උසස් අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිත – වී.සිවනාදන් මයා

(ලේකම්) : ඒ.ජේ.ක්‍රිස්ටි මයා, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම

# වාර්ෂික වාර්තාව

## 03. අධ්‍යක්ෂකගේ නිරීක්ෂණය

### අ. කෙටි හැඳින්වීම

රාමක්‍රිෂ්ණා පැවිදි සමාජයේ පූජකවරයෙකු හා නැගෙනහිර පළාතේ උසස් පඬිවරයෙකුද වූ අතර විද්‍යාව පමණක් නොව දමිළ සහ සෞන්දර්ය අංශයන්හිද පවා විශිෂ්ඨත්යක් ලැබූ ස්වාමි විපුලානන්දයන්ගේ (1892 - 1947) අනුස්මරණය කිරීම සඳහා ප්‍රාදේශීය කටයුතු සහ හින්දු සංස්කෘතික අමාත්‍යාංශය මඟින් මඩකලපුව කල්ලඩි උප්පෝඩයෙහි පිහිටි රාමක්‍රිෂ්ණාමිෂන් මණි මණ්ඩපයේදී 1982 මාර්තු මස 29 දී ස්වාමි විපුලානන්ද සංගිත හා නැටුම් ආයතනය ස්ථාපනය කරන ලදී. ස්වාමි විපුලානන්දයන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පළමුවන දමිළ මහාචාර්යවරයාද වන්නෝය. ආරම්භයේදී නැටුම් හා සංගීතය පිළිබඳ වසර 4 ක ඩිප්ලෝමා වැඩ සටහනක් මෙම ස්වාමි විපුලානන්ද සංගිත හා නැටුම් ආයතනයේ පවත්වන ලදී. ස්වාමි විපුලානන්ද සංගිත හා නැටුම් ආයතනය ස්ථාපනය කිරීමට හේතුව සිටි හිටපු ගරු චෙල්ලයියා රාජදුරෙයි, හින්දු සංස්කෘතික කටයුතු ඇමතිතුමා විසින් නොච්චිමුනෙයි ඉඩමේ වර්ෂ 1982 මාර්තු මාසයේදී මුල්ගල තබන ලදී. වර්ෂ 1986 සිට ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනයේ නව ගොඩනැඟිලි සංකීර්ණයේ සංගීත හා නැටුම් දේශණ හා ප්‍රායෝගික පන්ති ආරම්භ කරන ලදී. (දැනට ඇති ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ගොඩනැඟිලි සංකීර්ණය).

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය 1986 දී ස්ථාපනය කළ දා පටන් මෙම ආයතනය නැගෙනහිර විශ්ව විද්‍යාලය වෙත පැවරීමට පෙළඹවීම් ද ඇරඹිණ. ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනයේ සිසුන් විසින් නොකඩවා වැඩ වර්ජන හා මහජනයා විසින් මෙම ආයතනය ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයට පවරනා මෙන් ඉල්ලා උද්ඝෝෂණද පැවැත්වුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පාර්ලිමේන්තු නියෝජිතයන් හා විවිධ ආයතනවලින් කෙරුණු ඉල්ලීම් මත ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනය ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය හා අනුබද්ධ කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු ආරම්භ කරන ලදී. ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනය සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් උත්සවශ්‍රීයෙන් 2001 අප්‍රේල් මස 20 වන දින උසස් අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ සංවර්ධන අමාත්‍යාංශයට භාරදෙන ලදී. භාරදීමේ අවස්ථාවේදී, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා ඉල්ලා සිටියේ ස්වාමි විපුලානන්ද යන නාමය හා විශේෂයෙන් ආයතනය හඳුනාගැනීමේ නාම මාත්‍රය කිසිසේත් නොවෙනස්ව පැවතිය යුතු බවයි. විශ්ව විද්‍යාල කොමිෂම් සභාවේ නියෝගය පරිදි 2002 ජනවාරි මස 01 වනදා ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනය ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධ කරන ලදී. ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව උපාධිධාරි අධ්‍යයන පාඨමාලාවන් සඳහා සිසුන් අනුමත කරන ලද අතර ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය මඟින් උපාධි පිරිනමන ලදී. පිළිගත් ආයතනවලින් සංගීත හා නැටුම් ඩිප්ලෝමාව හැදෑරූ සිසුන් හට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේ

අනුමැතිය ඇතිව ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනයේ උපාධිය හැදෑරීම සඳහා අවුරුදු දෙකක හැදෑරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමටද අවකාශය ලැබෙනු ඇත. එසේම ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනයේ කාර්‍ය මණ්ඩලයේ වැටුප් ගෙවනු ලැබුවේ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය විසිනි. 2001 සිට 2005 දක්වා ආයතනය අධීක්ෂණය කරන ලද්දේ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කලා හා සංස්කෘතික පීඨය මඟිනි. ආයතනය විශ්ව විද්‍යාලයක් බවට උසස් කිරීම සඳහා කලා හා සංස්කෘතික පීඨයෙන් පහත සඳහන් අය සම්බන්ධීකරණ නිළධාරීන් ලෙස විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් පත් කරනු ලැබූහ. අධ්‍යයන හා පාලන අංශවල ගොඩනැගිලි සඳහා මුල්ගල තබන ලද්දේද මොවුන්ගේ සේවා කාලය තුළදීය.

මහාචාර්ය අම්මන්කිලි මුරුගදාස්
පීඨාධිපති කලා හා සංස්කෘතික පීඨය (2001-2002)

මහාචාර්ය එස් මෞනගුරු
ප්‍රධානියා, ලලිත කලා අධ්‍යනාංශය (2002-2004)

බී.සුගුමාර් මහතා
ප්‍රධානියා, ලලිත කලා අධ්‍යනාංශය (2004-2005)

සෞන්දර්ය කලා අධ්‍යාපනය වැඩි දියුණු කර උසස් අධ්‍යාපනය ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් විද්‍යායතනය ප්‍රකට උසස් අධ්‍යාපන ආයතනයක් බවට හඳුනා ගෙන ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනය නැගෙනහිර විශ්ව විද්‍යාලය හා අනුබද්ධ කිරීම නිළ වශයෙන් 2005.03.14 වන දින 1978 අංකः 16 වන විශ්ව විද්‍යාල පණතේ 24බී වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජ අති විශේෂ ගැසට් නිවේදනය (අංකः 1392/22 හා 03.06.2005) මඟින් අනුමත කරන ලදී. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව මඟින් 2005/2006 අධ්‍යයන වර්ෂය සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම එවනු ලැබීය. සියළු අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනයට නිළ වශයෙන් 2005 මාර්තු මස සිට අන්තර්ග්‍රහණය කරන ලදී. එනම් කාර්ය මණ්ඩලයේ සමහර දෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් ලෙසද කථිකාචාර්යවරුන් (පරිවාස) ලෙසද තවත් සමහර දෙනෙකු දරන්නාට පුද්ගලිකවූ යන පදනමක් මත උපදේශකයන් ලෙසද අන්තර්ග්‍රහණය කරනු ලැබූහ.

මෙම ආයතනය ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් ආයතනය, නැගෙනහිර විශ්ව විද්‍යාලයය යනුවෙන් නම් කරන ලදී. පහත සඳහන් විෂයයන්ට අදාළ අධ්‍යානාංශයන් අනුමත කරන ලදී.

- කර්නාටක සංගීත අධ්‍යානාංශය
- නැටුම්, නාට්‍ය හා රංගකලා අධ්‍යානාංශය
- කැටයම් හා තාක්ෂණ කලා අධ්‍යානාංශය

පළමුවන අධ්‍යක්ෂිකාව වූ බාලාම්බිගෙයි රාජේශ්වරන් මහත්මිය, ශාස්ත්‍රපති (සංගීත) M.A (Music), දර්ශනවේදී (ඉන්දියාව), M.Phil (India), 23.04.2014 දින සේවයෙන් විශ්‍රාම ලබා

ගැනීමෙන් අනතුරුව ආචාර්ය කේ.ප්‍රේමකුමාර්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය–ශෂ්‍ය විද්‍යාව (Agronomy ) 1වන ශ්‍රේණිය නැගෙනහිර විශ්ව විද්‍යාලය, 2012 අප්‍රේල් 19 දින දෙවන අධ්‍යක්ෂක වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පත් කරන ලදී.

**පිහිටීම**

මෙම ආයතනය නොච්චිමුනෙයි මඩකලපුව කල්මුනේ කරා යන ප්‍රධාන පාරේ මඩකලපුව නගරයේ සිට සැතපුම් 3½ ක් ඈතින් පිහිටා ඇත.

භාරත නැටුම් හා කර්නාටක සංගීතය යන පාඨමාලාවන් සඳහා වූ පළමුවන ශිෂ්‍ය කණ්ඩායම 2005/2006 අධ්‍යයන වර්ෂයේදී ඇතුළත් කරන ලදී. 2006/2007 අධ්‍යයන වර්ෂයේ සිට පහත සඳහන් පාඨමාලාවන් සඳහා සිසුන් බඳවා ගන්නා ලදී.

- කර්නාටක සංගීතය
- නැටුම් (භාරත)
- නාට්‍ය හා රංග කලාව
- කැටයම් කලාව

2013 වසරේදී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 997 කි. 2012/2013 වර්ෂය සඳහා සිසුන් 423 දෙනෙකු බඳවා ගන්නා ලදී.

පාඨමාලාවන් අනුව සිසුන් සංඛ්‍යාව පහත සඳහන් පරිදිවේ.

- කර්නාටක සංගීතය - 80
- නැටුම් (භාරත) - 50
- නාට්‍ය හා රංග කලාව - 50
- කැටයම් කලාව - 50

**ආ. මුදුන් පමුණුවා ගැනීම්**

විසිඑක් වන ශත වර්ෂය සඳහා වූ විසිඑක් වන ශතවර්ෂයේ උසස් අධ්‍යාපනය (HETC) යටතේ විශ්ව විද්‍යාල සංවර්ධන ප්‍රදාන සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිගෙන පහත සඳහන් මූලික අංග හතර වැඩි දියුණු කිරීම සඳහා ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයට රුපියල් මිලියන 15 ක් ප්‍රදානය කරන ලදී.

i. තොරතුරු තාක්ෂණය වැඩි දියුණු කිරීම
ii. ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම
iii. මෘදු කුසලතා වැඩි දියුණු කිරීම
iv. සමාජ සමඟිය වැඩි දියුණු කිරීම

**ඇ. අසමර්ථතාවය හා යුක්ති සාධනයන්**

ආයතනය සතුව ඇති අක්කර හයේ ඉඩම් ප්‍රමාණය විස්තීර්ණය කිරීමට හා වැඩි දියුණු කිරීමට ප්‍රමාණවත් නොවේ.

ශිෂ්‍යාවන් 200 දෙනෙකු සඳහා වූ නේවාසිකාගාරයක් ඉදි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා අනුමැතිය අපේක්ෂා කරන අතර අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුව ඇත. යටිතල පහසුකම් හිඟව පවතී. නව ඉදි කිරීමේ ව්‍යාපෘති සඳහා යෝජනාවන් පිළියෙළ කරමින් ඇත.

**ඈ.අනාගත සැළසුම්**

දැනට පවතින අධ්‍යනාංශ පහත සඳහන් පීඨයන්ගේ තරාතිරමට උසස් කිරීම සඳහා සැළසුම් කර ඇත.

- කර්නාටක සංගීත පීඨය
- නැටුම් ( භාරත ) පීඨය
- නාට්‍ය හා රංග කලා පීඨය
- කැටයම් හා තාක්ෂණ කලා පීඨය

තාක්ෂණ කලා විශේෂ උපාධි වැඩසටහන ආරම්භ කිරීම සඳහා යෝජනා අදාළ අධ්‍යනාංශය විසින් ලබා ගෙන ඇත. අධ්‍යයන පාඨමාලා හතරේ විෂයමාලාවන් ප්‍රතිශෝධනය කිරීම සමාලෝචනය කරමින් පවතී.

<table>
<tr><th colspan="5">04. 31.12.2013 දිනට සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර</th></tr>
<tr><th>දෙපාර්තමේන්තුව</th><th>පාඨමාලාව</th><th>මුළු සිසුන් සංඛ්‍යාව</th><th>මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව</th><th>මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව</th></tr>
<tr><td>සංගීතය</td><td>ලලිත කලා උපාධිදාරි (සංගීතය)</td><td>305</td><td>14*</td><td>02</td></tr>
<tr><td rowspan="2">නැටුම් හා නාට්‍ය හා රංග කලාව</td><td>ලලිත කලා උපාධිදාරි (නැටුම්)</td><td>197</td><td>07</td><td rowspan="3">01</td></tr>
<tr><td>ලලිත කලා උපාධිදාරි (නාට්‍ය හා රංග කලාව)</td><td>249</td><td>08*</td></tr>
<tr><td>කැටයම් කලාව</td><td>ලලිත කලා උපාධිදාරි (කැටයම් කලාව)</td><td>246</td><td>08*</td></tr>
<tr><td colspan="2">පුස්තකාලය</td><td>-</td><td>01</td><td>02</td></tr>
<tr><td colspan="2">පාලන</td><td>-</td><td>-</td><td>09</td></tr>
<tr><td colspan="2">මුදල්</td><td>-</td><td>-</td><td>05</td></tr>
<tr><td colspan="2">එකතුව</td><td>997</td><td>38</td><td>19</td></tr>
</table>

*නැටුම් හා නාට්‍ය හා රංග කලාව, කැටයම් කලාව හා තාක්ෂණ කලාව යන දෙපාර්තමේන්තුවල ශිෂ්‍ය/කාර්යමණ්ඩල අනුපාතය ඉතා අඩුවෙන් පවතින අතර පුරප්පාඩු සංඛ්‍යාව වැඩියෙන් බිහි කළ යුතුය .

| **05. 31.12.2013 දිනට දේශීය සිසුන් පිළිබඳ විස්තර** | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| දෙපාර්තමේන්තුව | පාඨමාලාව | මාධ්‍යය | 2013 දී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 2013 1වන වසරේ 1වන අර්ධ වාර්ෂිකය | 2013 1වන වසරේ 2 වන අර්ධ වාර්ෂිකය | 2 වන වසරේ සිසුන් | 3 වන වසරේ සිසුන් | 4 වන වසරේ සිසුන් |
| සංගීතය | ලලිත කලා උපාධිදාරි (සංගීතය) | සිංහල | 305 | 72 | 77 | 79 | 46 | 31 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | ලලිත කලා උපාධිදාරි (නැටුම්) | | 197 | 39 | 43 | 51 | 34 | 30 |
| | ලලිත කලා උපාධිදාරි (නාට්‍ය හා රංග කලාව) | | 249<br>499 | 43 | 50 | 54 | 48 | 54 |
| කැටයම් කලාව | ලලිත කලා උපාධිදාරි (කැටයම් කලාව) | | 246 | 47 | 52 | 50 | 50 | 47 |
| **එකතුව** | | | **997** | **201** | **222** | **234** | **178** | **162** |

ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම 2005/2006 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුලත් කර ගන්නා ලද අතර එම සිසුන් සංගීතය (සිසුන් 27) හා නැටුම් (සිසුන් 18) අදාළ පාඨමාලාවන් හදාරා 2010 වසරේදී ඔවුන් උපාධි ලබා ගත්හ.

දෙවන ශිෂ්‍ය කණ්ඩායම 2006/2007 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුලත් කර ගන්නා ලද අතර එම සිසුන් සංගීතය (සිසුන් 44) නැටුම් (සිසුන් 20) නාට්‍ය හා රංග කලාව (සිසුන් 46) හා කැටයම් කලාව (සිසුන් 06) අදාළ පාඨමාලාවන් හදාරා 2012 වසරේදී ඔවුන් උපාධි ලබා ගත්හ.

තුන්වන ශිෂ්‍ය කණ්ඩායම 2007/2008 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුලත් කර ගන්නා ලද අතර 2013 වසරේදී ඔවුන් උපාධි ලබා ගත්හ.

| **06. 31.12.2013 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර** | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දෙපාර්තමේන්තුව | පාඨමාලාව | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | සහකාර කථිකාචාර්ය | උපදේශකවරුන් |
| සංගීතය | ලලිත කලා උපාධිදාරී (සංගීතය) | දෙමළ | – | – | – | – | 12 | 01 | 01 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | ලලිත කලා උපාධිදාරී (නැටුම්) | | – | – | – | – | 04 | 03 | - |
| | ලලිත කලා උපාධිදාරී (නාට්‍ය හා රංග කලාව) | | – | – | 01 | 01 | 04 | 04 | – |
| කැටයම් කලාව | ලලිත කලා උපාධිදාරී (කැටයම් කලාව) | | – | – | – | – | 02 | 06 | – |
| පුස්තකාලය | | | – | – | – | – | 01 | – | – |
| පරිඝණක ඒකකය | | | – | – | – | – | – | – | 01 |
| **එකතුව** | | | – | – | 01 | 01 | 23 | 14 | 02 |

මුළු අධ්‍යයන පුරප්පාඩු සංඛ්‍යාව වන 32 න් 24 දෙනෙකු කථිකාචාර්යවරුන් (පරිවාස) වන අතර ඉන් කථිකාචාර්යවරුන් (පරිවාස) 6 දෙනෙකු දර්ශනසූරි (Ph D) පාඨමාලාව හදාරන අතර අනෙක් කථිකාචාර්යවරුන් පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා බලාපොරොත්තුවෙන් සිටිති.

| **07. 31.12.2013 දිනට අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර** | | | | |
|---|---|---|---|---|
| **දෙපාර්තමේන්තුව** | **විධායක කාර්ය මණ්ඩලය** | **කාර්මික කාර්ය මණ්ඩලය** | **ලිපිකාර හා ඒ හා අදාළ කාර්ය මණ්ඩලය** | **සුළු සේවකයන්** |
| සංගීතය | – | – | 01 | 01 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | – | – | – | 01 |
| කැටයම් හා තාක්ෂණ කලාව | – | – | – | – |
| පුස්තකාලය | 01 | – | 01 | 01 |
| මුදල් | 01** | – | 04* | 01 |
| පාලන | 02 | – | 08 | 01 |
| **එකතුව** | **05** | – | **14** | **05** |

වර්ෂ 2008 පසුව අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිසිම අංශයකටවත් පුරප්පාඩු කිසිවක් බිහිකර නොමැත.

* 2012 වසරේදී ගබඩා භාරකරුගේ සේවය අත්හිටුවා ඇත .

** 2012 වසරේදී ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිගේ සේවය අත්හිටුවා ඇත .

| 08. 31.12.2013 දිනට පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශණ පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශණයට පත් කරන ලද | අලෙවි කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ ගණන | – | – | 01 |
| ආ. නවෝත්පාදන ගණන | – | – | – |
| ඇ. සඟරා ගණන | – | – | – |
| ඈ. පොත් ගණන | – | – | – |
| ඉ. ප්‍රවෘත්ති ලිපි | 13 | – | 04 |
| ඊ. වෙනත් | 01 | – | 01 |
| **එකතුව** | **14** | - | **06** |

මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 32 දෙනා අතරින් 29 දෙනෙකු පරිවාස කාලයේ පසුවන කථිකාචාර්යවරුන් වන අතර ඔවුන් තම දර්ශනසූරි/දර්ශනපති (Ph.D/M.Phil ) පාඨමාලා පර්යේෂණ කටයුතුවල නිරතවී සිටිති.

| 09. 31.12.2013 දිනට වැඩ සටහන් , සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| විෂය | සහභාගි වන ලද | නිමකරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා ගණන | | | |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා ගණන | | | |
| ඇ. උපාධි පාඨමාලා ගණන | | | |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා ගණන | | | |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා ගණන | 01 | 01 | 01 |
| ඊ. වෙනත් | | | |
| **එකතුව** | 01 | 01 | 01 |

අදාළ අධ්‍යයන අංශවල සිසුන් නාට්‍ය හා රංගකලාව, කැටයම් හා තාක්ෂණ කලාව යන වැඩමුළුවලට සහභාගි වී සිය ඉදිරිපත්කිරීම්ද සමඟ එය නිමාවට පත්විය.

| 10. 31.12.2013 දිනට ලබා ගත් සම්මාන පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| විෂය | සම්මාන ගණන | අධ්‍යයන කාර්ය මණ්ඩල ගණන | ශිෂ්‍ය සංඛ්‍යාව |
| අ. දේශීය සම්මාන | – | – | – |
| ආ.ජාතික සම්මාන | 02 | 01 | 05 |
| ඇ.ජාත්‍යයන්තර සම්මාන | 03 | | |
| ඈ. වෙනත් | | 01 | 10 |
| **එකතුව** | | | |

| 11. 31.12.2013 දිනට පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | | |
|---|---|---|
| **විෂය** | **2012**<br>**රු.** | **2013**<br>**රු.** |
| අ. පුද්ගල වේතන | 32,873,382.66 | 42, 917, 599.72 |
| ආ.ගමනාගමනය | 211,933.00 | 156, 364.01 |
| ඇ. සැපයීම් | 3, 354, 262. 57 | 2, 801,251.09 |
| ඈ.නඩත්තුව | 1, 045, 978.53 | 1, 252,750.87 |
| ඉ.කොන්ත්‍රාත්තු සේවා | 11, 137,619.11 | 13,469,937.47 |
| ඊ.වෙනත් | 2, 681,065.59 | 6 ,354,578.60 |
| **එකතුව** | 51,304, 065.45 | 66, 052,481.76 |

අනුපිළිවෙලින් නව සිසුන් ඇතුළත් කර ගැනීම ඉහළ යාමත් හා ආරක්ෂක සේවාවන් පිටින් ලබා ගැනීමත් හේතුවෙන් සැපයීම් හා කොන්ත්‍රාත්තු සේවා වියදම් වැඩි විය.

| 12. 31.12.2013 දිනට මූලධන වියදම් පිළිබඳ විස්තර | | |
|---|---|---|
| **විෂය** | **2012**<br>**රු.** | **2013**<br>**රු.** |
| අ. ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ අත්කර ගැනීම | 7,992,878.74 | 34,363,228.19 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම | 75,376.48 | - |
| ඇ.ගොඩනැගිලි හා සැළසුම් අත්කර ගැනීම | 6,034,606.36 | 26,955,779.69 |
| ඈ.වෙනත් | - | - |
| **එකතුව** | **14,102,86.58** | **361,319,007.88** |

නව සිසුන් වැඩි සංඛාවක් ඇතුළත් කර ගැනීම හේතුවෙන් භාණ්ඩ, කාර්යාල, උපකරණ හා ගොඩනැගිලි හා සැළසුම් අත්කර ගැනීමේ වියදම් වැඩි විය.

| 13. 31.12.2013 දිනට ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය /විදේශීය ආධාර) | | | | | |
|---|---|---|---|---|---|
| **නම හා විස්තර** | **ණය /ප්‍රදාන** | **ණය ලබාදුන් ආයතනය** | **TCE**<br>**රු.** | **RFA**<br>**රු.** | **DF**<br>**රු.** |
| HETC ව්‍යාපෘතිය | ප්‍රදාන | ලෝක බැංකුව | 15 මිලියන | | |
| **එකතුව** | | | 15 මිලියන | | |

තොරතුරු තාක්ෂණ කුසලතා, ඉංග්‍රීසි ,මෘදු කුසලතා හා සමාජ සමගිය වැඩි දියුණු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා වෙනුවෙන් HETC-UDG යටතේ HETC ලෝක බැංකුව මගින් මිලියන 15 ක් ප්‍රදානය කරන ලදී.

| 14. 31.12.2013 දිනට ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය /විදේශීය ආධාර) | | | | | |
|---|---|---|---|---|---|
| නම | TCE රු. | 2012 දී වියදම් රු. | 2013 දී වියදම් රු. | 31.12.2013 දිනට සමුච්චිත වියදම් රු. | භෞතික ප්‍රගතිය % |
| HETC ව්‍යාපෘතිය | 15 මිලියන | – | – | – | – |
| **එකතුව** | 15 මිලියන | – | – | – | |

මුදල් ප්‍රමාද වී ලැබුණු බැවින් එම මුදල් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය .

| 15. 31.12.2013 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම් ) | | | |
|---|---|---|---|
| **විෂයය** | **2013 දී වෙන්කිරීම්** | **2013 දී වියදම** | **ඉතිරිකිරීම්/වැඩිවීම්** |
| අ. පුනරුත්ථාපන වියදම් ව්‍යාපෘති | 69,635,789.90 | 72,022,453.79 | 2 ,386,663.89 |
| ආ. මූලධන වියදම් ව්‍යාපෘති | 50,477,000.00 | 61,319,007.88 | 10, 842,007.88 |
| ඇ. ව්‍යාපෘති – දේශීය ආධාර | - | - | - |
| ඈ. ව්‍යාපෘති– විදේශීය ආධාර | - | - | - |
| **එකතුව** | **120,112,789.90** | **133.341,461.67** | **13,228,671.77** |

සිසුන් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් නොකඩවා වැඩිවී ඇත .

| 16. 31.12.2013 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ආදායම්) | | | |
|---|---|---|---|
| **ආදායම් මාර්ග** | **2013 දී වෙන්කිරීම්** | **2013 දී ලැබීම්** | **ඌණතා /අතිරික්ත** |
| උපාධි පාඨමාලා | 25,3000. 00 | 813,720. 00 | 560,720. 00 |
| පශ්චාත් උපාධි පාඨමාලා | – | – | – |
| උපදේශණ සේවා | – | – | – |
| වෙනත් | – | – | – |
| **එකතුව** | **253,000. 00** | **813,720. 00** | **560,720. 00** |

ආයතනයේ මුදල් අයකරන පාඨමාලා කිසිවක් නොමැත. එබැවින් ආදායම් කිසිවක් නොමැත. දැනට සිසුන් ලියාපදිංචි කිරීමෙන් ලබා ගත් ගාස්තු මඟින් ආදායම් ලැබී ඇත.

| 17. 31.12.2013 ට මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය | | |
|---|---|---|
| **විෂයය** | **සූත්‍රය** | **එක් සිසුවෙකු සඳහා වියදම රු.** |
| අ. එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම් (පුවි) | පුනරාවර්තන වියදම්/ සිසුන් ගණන | 67,153.94 |
| ආ. එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම් (ප්‍රාවි) | ප්‍රාග්ධන වියදම්/ සිසුන් ගණන | 22,864.32 |
| **එකතුව** | | **429, 560.17** |

පසුගිය වසර හා සසඳන කල්හි සිසුන් ඇතුලත් කර ගැනීමේ සංඛ්‍යාව වැඩිවීම හේතු කොටගෙන මෙම වසරේ එක් සිසුවෙකු සඳහා වැයවන මුදල අඩු වී පවතී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

CHECKED / RETURNED
Signature: 19/12/14
Name: H.M. Wijeratne

ඊඑන්/බීටී/බී/එස්විඅයිඑස්/1/13/02

2014 ඔක්තෝබර් 15

අධ්‍යක්ෂ,

සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය

නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම වාර්තාව විශ්ව විද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ලෙසද සළකනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

CHECKED

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩතහනමට ලක්වූ හෝ සේවයෙන් පහකරන ලද නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ එකතුව රු.573,338 ක් වූ ණය ශේෂ වසර 2 සිට හිඟව පැවති නමුත් එම ශේෂ අයකර ගැනීම සඳහා ආයතනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

CHECKED

16

(ආ) අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව එකතුව රු.14,393 ක් වූ වැටුප් ණය වසර 2 කට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(ඇ) නැඟෙනහිර විශ්ව විද්‍යාලයට ගෙවිය යුතු රු.12,046 ක මුදලක් නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව වසර 2 කට වැඩි කාලයක් හිඟව පැවතුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් අයිතමය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ඉඩම් සහ ගොඩනැඟිලි | 39,078,017 | හිමිකම් ඔප්පු |
| (ආ) | පිරියත හා යන්ත්‍රෝපකරණ | 2,294,781 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඇ) | මෝටර් වාහන | 237,372 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඈ) | ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ | 23,107,830 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඉ) | වෙනත් වත්කම් | 777,275 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඊ) | පොත් සහ වාර සඟරා | 242,287 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (උ) | සුඛසාධන භාණ්ඩ | 1,585,071 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඌ) | සෞඛ්‍ය උපකරණ | 105,432 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඔ) | රසායනාගාර උපකරණ | 23,300 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඕ) | ක්‍රීඩා භාණ්ඩ | 978,977 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (එ) | ණය සහ අත්තිකාරම් | 7,067,789 | කාල විශ්ලේෂණය සහ විස්තරාත්මක උපලේඛන |

### 2.2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2013 මැයි 23 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ අංක 08/2013 සහ පොදු ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 1998 මාර්තු 06 දිනැති අංක PE/01/174/11(b) දරන ලිපිය ප්‍රකාර රජයේ නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණත්වය සඳහා වන දීමනා රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්ය මණ්ඩලය සඳහා නොගෙවිය යුතුය. එසේ නමුදු, වසර 2012 සිට 2013 මැයි 31 දින දක්වා රු.27,650 ක මුදලක් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තිදෙනෙකු සඳහා භාෂා ප්‍රවීණතා දීමනා ලෙස ගෙවා තිබුණු අතර, 2014 අප්‍රේල් 30 දක්වා අදාළ නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. 2013 මැයි මස අදාළ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන සභා චක්‍රලේඛය ලැබීමෙන් පසුව දීමනා ගෙවීම 2013 ජූනි මස සිට අත්හිටවූ බව අධ්‍යක්ෂවරයා විසින් දන්වා තිබුණි.

CHECKED

## 2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 109 වැනි වගන්තිය | විගණිත මූල්‍ය ප්‍රකාශන සහ වසර 2012 සඳහා වන මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන්වූ විගණකාධිපති වාර්තාව 2014 අප්‍රේල් 30 දක්වා රජයේ ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි<br>මු.රෙ. 756 | සමාලෝචිත වර්ෂයේ විගණිත දිනය වූ 2014 මැයි 22 දින දක්වා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා නොතිබුණි. |
| (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය<br>X වන පරිච්ඡේදයේ 20.6 වැනි වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු සම්බන්ධව විස්තර පොදු 96 ආකෘතිය මඟින් විගණකාධිපතිවරයා වෙත වාර්තා කර නොතිබුණි. |
| XXVII පරිච්ඡේදයේ 3.1 වන වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පිටවීම පැමිණීමේ ලේඛනයේ සටහන් කර නොතිබුණි.<br>අධ්‍යයන කාර්ය මණ්ඩලය තම පැමිණීම පමණක් සටහන් තැබීම සාමාන්‍ය සම්ප්‍රදාය බව අධ්‍යක්ෂවරයා මා වෙත දැනුම් දෙන ලදී. |

CHECKED

18

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩකටයුතුවලින් වූ ප්‍රතිඵලය, රු.68,364,000 ක් වූ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමට පෙර රු.70,750,664 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.57,500,000 රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමට පෙර එම වර්ෂයේ රු.53,926,128 ක ඌනතාවයක් වූයෙන් රු.16,824,536 කින් මූල්‍ය ප්‍රතිඵලයේ තවදුරටත් පිරිහීමක් විය. පුද්ගල පඩිනඩි, විභාග සහ සුභසාධන වියදම් ආදියේ වැඩිවීම එයට හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළදී විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතුවල කාර්යසාධනය පහත පරිදි විය.

(අ) විභාග ප්‍රතිඵල

2013 වර්ෂයේ පවත්වන්නට යෙදුණු අවසන් විභාග සහ උපාධිධාරීන්ගේ නික්ම යාමට අදාළ විස්තර පහත පරිදි වේ.

| විස්තරය | සංගීත පීඨය | නර්තන පීඨය | නර්තන හා රංගකලා පීඨය | දෘශ්‍ය හා තාක්ෂණික කලා පීඨය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී අවසන් විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 26 | 25 | 50 | 43 |
| විභාග සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 19 | 22 | 46 | 33 |
| උපාධි විභාග සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 73.07 | 88 | 92 | 76.74 |

CHECKED

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i) අවසන් විභාගය සඳහා පෙනී සිටි 26 ක්වූ සංගීත පීඨ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 19 දෙනෙකු හෙවත් විභාගයට පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 73.07 ක ප්‍රතිශතයක් විභාගය සමත්වී තිබුණි.

(ii) අවසන් විභාගය සඳහා පෙනී සිටි 43 ක් වූ දෘශ්‍ය සහ තාක්ෂණ කලා පීඨ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 33 දෙනෙකු හෙවත් විභාගයට පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 76.74 ක ප්‍රතිශතයක් විභාගය සමත්වී තිබුණි.

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂයේ එක් එක් පීඨයේ මුළු පිරිවැය සහ ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | සංගීත පීඨය | නර්තන පීඨය | නර්තන හා රංගකලා පීඨය | දෘශ්‍ය හා තාක්ෂණික කලා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.) | 12,496,872 | 9,350,020 | 21,280,967 | 28,894,594 | 72,022,454 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 305 | 197 | 249 | 246 | 997 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු.) | 40,973 | 47,462 | 85,466 | 117,458 | 67,154 |

රු.117,458 ක් වූ වැඩිම ඒක ශිෂ්‍ය පිරිවැය දෘශ්‍ය හා තාක්ෂණ කලා පීඨයෙන් වාර්තා වූ අතර, රු.40,973 ක් වූ අවම අගය සංගීත පීඨයෙන් වාර්තා විය.

(ඇ) මහපොළ ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යාධාර

ශිෂ්‍යාධාර ලෙස රු.5,552,500 ක මුදලක් සිසුන් 572 ක් වෙත ගෙවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී සිසුන් 108 දෙනෙකු වෙනුවෙන් රු.660,000 ක මුදලක් මහපොළ ශිෂ්‍යාධාර ලෙස ගෙවා තිබුණද සිසුන් 26 දෙනෙකු පාඨමාලා සඳහා පැමිණීම නවතා දමා තිබූ බැවින් විගණිත දිනය වූ 2014 මැයි 22 දින දක්වා පිළිවෙලින් මහපොළ හා ශිෂ්‍යාධාර රු.17,500 ක් සහ රු.265,700 ක් ගෙවා නොතිබුණි.

CHECKED

4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) රු.මිලියන 5 ක චෙක්පත් වංචාවකට සහ රු.මිලියන 4.5 ක වංචනික ගෙවීම් සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ ජ්‍යෝෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී සහ ගබඩා භාරකරුට එරෙහිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XXII පරිච්ඡේදයේ 5.2 සහ 5.3 වගන්ති අනුව මූලික පරීක්ෂණයක් ආරම්භ කිරීමට ආයතනයට වසරකට ආසන්න කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී බුමුතුරුණු, චිත්‍ර ආධාරක, මූර්ති සහ පුටු, ඇඳන් මිලදී ගැනිම වෙනුවෙන් රු.1,395,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර, මෙයට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ආයතනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මඩකලපුවේ පුද්ගලික බැංකුවක නාඳුනන පුද්ගලයෙකුගේ නමින් පවත්වාගෙන ගිය බැංකු ගිණුමක් හරහා ආයතනයේ නිලධාරියෙකු විසින් සිදුකළ රු.3,622,315 ක් වටිනා චෙක්පත් 14 ක් මුදල් කරගැනීමෙ වංචාව සම්බන්ධයෙන් සිදුවූ අලාභය නැවත අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමකින් තොරව රු. මිලියන 1.27 ක් වූ පිරිවැයකට ආයතනය මඟින් ඡායා පිටපත් යන්ත්‍ර සඳහා ටෝනර් 106 ක් මිලදී ගෙන තිබුණි. එම ටෝනර් තත්ත්වයෙන් බාල වීම හේතුවෙන් ඡායා පිටපත් යන්ත්‍ර කොටස් (Drum, Drum Blade, Heater Roller) හානියට පත්වී තිබුණි. මෙ හේතුවෙන් විගණිත දිනය වූ 2014 මැයි 22 දක්වා එම ටෝනර් 21 ක් ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව ගබඩාවේ පැවතුණි.

4.3 මානව සම්පත් කළමනාකරණය

---

2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යා පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්ය මණ්ඩලය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| අධ්‍යයන | 38 | 35 | 03 | - |
| අධ්‍යයන ආධාරක | 07 | 01 | 06 | - |
| පරිපාලන | 01 | 01 | - | - |
| පරිපාලන ආධාරක | 04 | 02 | 02 | - |
| තාවකාලික (අධ්‍යයන) | 06 | 01 | 05 | - |
| බාහිර කථිකාචාර්ය | - | - | - | 15 |
| එකතුව | 56 | 40 | 16 | 15 |

CHECKED

21

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කෙරේ.

පුරප්පාඩු 16 ක් පිරවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම ආයතනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

අංක PF/R/2/2/3/5/(4) දරන 2010 මාර්තු 10 දිනැති රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාර ආයතනය සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාර සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත තථ්‍ය ආදායම හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ප්‍රසම්පාදනය

CHECKED

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

22